# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/145/20 ඔබේ අංකය :

2020.08.19

නිලක්ෂ කරුණානායක මහතා,
අලෙවි කළමණාකරු,
ජෝර්ජ් ගුණරත්න ඔප්ටොමෙට්‍රිස්ට් ආයතනය,
අංක 133,
ඕල්කට් මාවත,
කොළඹ 11.

**ආකර්ශණීය වට්ටමක් යටතේ අවු කණ්ණාඩි ලබා ගැනීම සම්බන්ධව.**

***2020.08.10 දිනැති අංක SLPIA/OUT/128/2020 දරන ලිපිය හා සබැඳේ.***

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සාමාජික සාමාජිකාවන් වෙත හා ඔවුන්ගේ පවුලේ සාමාජික සාමාජිකාවන් වෙත 35% ඉතා ආකර්ශණීය වට්ටමක් යටතේ දෘශ්‍ය උපකරණ ඔබ ආයතනය මගින් ලබා දීමට එකගතාවය පල කිරීම සම්බන්ධයෙන් අප සංගමයේ කෘතඥ පූර්වක ස්තූතිය පුදකර සිටින්නෙමු.

එමෙන්ම ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස විද්‍යාලයේ මේ වන විට පුහුණුව ලබමින් සිටින ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක නිලධාරිණියන් 50 දෙනෙකු සඳහා අවු කණ්ණාඩි ලබාදීමටද අප සංගමයේ විධායක කමිටුව විසින් අදහස් කර සිටින අතර, ඒ සම්බන්ධයෙන් සලකා බලා ඔබ ආයතනය මගින් ඉතා ආකර්ශණීය වට්ටමක් යටතේ අවු කණ්ණාඩි ලබා දෙන මෙන් ඉල්ලා සිටින්නෙමු.

එමෙන්ම මෑතකදී පුහුණුව නිමාකර විසිර යන ලද ආධුනික උප පොලිස් පරීක්ෂක නිලධාරීන් 200 ක් පමණ දැනට ක්ෂේත්‍රයේ රාජකාරි නියැලී සිටින අතර, එම නිලධාරීන් සඳහා ද ඉහත ආකර්ශණීය වට්ටමක් ලැබෙන්නේනම් අවු කණ්ණාඩි 200 ක් මිලදී ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

අභිමානවත් පොලිසියක් ගොඩනගමු.